කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

කතෝලික ධර්මය

කාලය පැය 2 යි

10 ශ්‍රේණිය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පහත ප්‍රකාශවල නිවැරදි ප්‍රකාශය තෝරා යටින් ඉරක් අඳින්න.

01) ශුද්ධ බයිබලය ලේඛනගත වූ කාලය
 i. ක්‍රි.පූ. 950 - ක්‍රි.ව. 100
 ii. ක්‍රි.පූ. 950 - ක්‍රි.පූ. 100
 iii. ක්‍රි.පූ. 100
 iv. ක්‍රි.ව. 100

02) ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ අඩංගු වන්නේ,
 i. ජීවන සහා සම්ප්‍රදායයි
 ii. අතීත කථාය
 iii. ගැලවීමේ ඉතිහාසය
 iv. දෙවියන් වහන්සේ පිළිබඳවය

03) පුරාණ ගිවිසුමේ පාස්කු පිළිවෙත පූර්ණත්වයට පත් වූයේ ක්‍රිස්තුස් වහන්සේගේ
 i. පාදදෝවනයෙනි
 ii. ප්‍රාතිහාර්යනි
 iii. බෞතිස්මයෙනි
 iv. කුරුසියේ යාගයෙනි

04) එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථයකි
 i. ප්‍රඥාව
 ii. හග්ගායි
 iii. ටීකා
 iv. දානියෙල්

05) ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ,
 i. හොක්මා
 ii. මතටෙස්
 iii. පොගටෙස්
 iv. නබි

06) ජේසුස් වහන්සේගේ කුරුසය ඉහළ ගසා තිබූ පුවරුවෙ හි අර්ථය
 i. ජේසු නසරේනු ජුදයන්ගේ රජයැයි කියාගනී
 ii. ජේසු නසරේනු ජුදයන්ගේ රජය
 iii. මොහු ජුදයන්ගේ රජයයි සිතයි
 iv. ඉහත කිසිවක් නොවේ

07) "පෙන්තකොස්ත" යන්නෙහි අර්ථය
 i. ශුද්ධාත්මයාණෝ
 ii. ශක්තිය
 iii. සැඩසුළඟ
 iv. පණහ

08) ශු.පාවුලු තුමාගේ පළමු ධර්මදූත චාරිකාවේ අවසන් නගරය වූයේ

i. දර්බය
ii. ජෙරුසලම
iii. ලුස්ත්‍රාව
iv. සලමිසය

09) ශ්‍රී ලංකාවට පැමිණි පළමුවන ධර්මදූත කණ්ඩායම

i ජේසු නිකායික
ii. දොමිනිකාන නිකායික
iii ප්‍රැන්සිස්කාන නිකායික
iv. ආගුස්තීනු නිකායික

10) ශු.සභාවේ පනත්

i. තුනකි
ii. හයකි
iii. නවයකි
iv. දහයකි

11) දස පණත ඇතුළත් ශු. බයිබලිය ග්‍රන්ථය වන්නේ

i. ද්විතිය නිති සංග්‍රහය
ii. උත්පත්ති
iii. ගණන් කථාව
iv. එළිදරව්ව

12) ප්‍රධාන දිවැසිවරයෙකි

i. සකරියා
ii. මිකා
iii. ජෙරමියා
iv. ජෝනා

13) ශු.බයිබලයේ පළමු මැවීමේ කථාව අයත් සම්ප්‍රදාය

i. පූජක
ii. යාවේ
iii. එලොහිම්
iv. ද්විතිය නිති සම්ප්‍රදාය

14) දෙව්මිණගේ පියා බෙහෙවින් රෝගාතුර විය. මේ නිසා ඔහුගේ මව දෙහිගෙඩියක් මතුරා ගෙනවිත් දුන්නාය. මෙය කී වෙනි පණතට විරුද්ධපාපයක්ද ?

i. පළමු පණතට
ii. දෙවන පණතට
iii. තුන්වන පණතට
iv. හතරවන පණතට

15) "ඉන්පසු මම අලුත් ................ ක් ද අලුත් .................... ක් ද දිටිමි" මෙහි හිස්තැනට සුදුසු පදය.

i. පොළොව, අහස
ii. අහස, බලාපොරොත්තුව
iii. අහස, පොළොව
iv. ඉහත කිසිවක් නොවේ

16) පස්වන පණත නම් කරන්න

i. මව්පියන්ට සංග්‍රහ කිරීම
ii. ජීවිත විනාශ නොකාව
iii. පදොල ආලය කොර
iv. අන්වස්තු ආශා නොකරව

17) ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග වන්නේ,

i. පාස්කු බැටළුවා
ii. නුමුහුන් රොටී
iii. තිත්තපලා
iv. ඉහත සියල්ලම

18) සමාජ සේවයේ ප්‍රසාද නිධානයකි

i. දිව්‍ය සත්ප්‍රසාදය
ii. රෝගීන්ගේ ආලේපය
iii. පාපොච්චාරණය
iv. ආශිර්වාදකාර බන්ධනය

19) ප්‍රසාද ස්නාපනය සක්‍රමේන්තුව තුළින් අප .......................... කැඳවීම ලබා ගනී.

a) පොදු පූජකවරය.
b) සියලුම සක්‍රමේන්තු ලබා ගැනීම
c) පූජක, දිවැසි , රාජකීය
d) නිල පූජකවරය

i. නිවැරදි වේ. වැරදිය
ii. නිවැරදිය වැරදිය
iii. නිවැරදිය
iv. ඉහත සියල්ලම වැරදිය

20) විහඟගේ මව පාසලේ ආගම විෂය උගන්වන අතර ඇය ආගමට ලැදි කාන්තාවකි. ඇය මිසමේ දුප්පත් ළමුන්ට නොමිලේ ආගම කියාදෙමින්, මරිය හමුදාවේ සක්‍රිය සාමාජිකාවකි. ඇය ඉටුකරනුයේ ගිහි ජනතාව සතු,

i. පූජක කාර්යය
ii. දිවැසිවර කාර්යය
iii. එඬේරික කාර්යය
iv. ඉහත කිසිවක් නොවේ

## 2 - කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01) කෙටි පිළිතුරු සපයන්න.

01. දානියෙල් පොත අයත් වන්නේ කුමන පොත් ගණයටද ?
02. 'තියෝපිලස්' යන්නෙහි අර්ථය කුමක්ද ?
03. ද්විත්වවාදය යනු කුමක්ද ?
04. සුදුවර්ණයෙන් සංකේතවත් කරන ලද වර්ණ සංකේතය අර්ථය කුමක්ද ?
05. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා කවුද ?
06. ශුද්ධ වූ පාවුලුතුමා සමඟ පළමු ධර්මදූත ගමනට සහභාගී වූ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.
07. 'ප්‍රඥාව' සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය නම් කරන්න.
08. නව ගිවිසුමේ පළමුවෙන්ම ලේඛනගත වූ සුබාරංචිය හා වර්ෂය නම් කරන්න.
09. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 2 ක් ලියන්න.
10. ශුද්ධ වූ බයිබලයේ ප්‍රධාන කර්තෘ හා අනු කර්තෘ නම් කරන්න.

02)

01. දේව වචනයේ (අනාවරණයේ) මූලාශ්‍ර 2 කුමක්ද ?
02. ~~අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්ම ලියන්න.~~
03. දේව වචනය අධ්‍යනයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

03)

01. පාවුළුතුමා ලිපි ලිවීමේ පරමාර්ථ 2 ක් ලියන්න.
02. පාවුළුතුමා විසින් ලියන ලද සංදේශ 3 ක් ලියන්න.
03. මුල් කිතුණු සභාවේ ලක්ෂණ 2 ක් ලියන්න.

04)

1. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ 2 ක් ලියන්න.
2. සංකේත භාවිතයේ පරමාර්ථ 2 ක් ලියන්න.
3. පහත සංඛ්‍යා සංකේතවල අර්ථය ලියන්න.

   4

   7

   10

   12

05)

1. ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් පදය හා එහි අර්ථය ලියන්න.
2. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද 3 ක් ලියන්න.
3. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ 5 ක් ලියන්න.

06) ශු.සභාවේ වර්ධනය හා අභියෝගවලට නොසැලී ඉදිරියට යාමට අවශ්‍ය බලය පතා 10 ශ්‍රේණියේ සිසුවියක ලෙස කිවිය හැකි යාච්ඤාවක් ලියන්න. (යාච්ඤාවේ ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.)

e තක්සලාව The National e-learning Portal for The General Education